ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - **2020/2021**

**EPD4536/ESD2236 -** සමාජ මනෝවිද්‍යාව

කාලය - පැය තුනයි. (03)

| දිනය - 2023.07.16 | වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා |
|---|---|

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. 'සමාජ මනෝවිද්‍යාව' යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

02. සමාජ මනෝවිද්‍යාව ඉගෙනීමෙන් ලබාගත හැකි වාසි **පහක්** (05) ලැයිස්තුගත කරන්න.

03. ආකල්ප පිළිබඳ ABC ආකෘතිය රූප සටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

04. 'සමාජ ස්වීයත්වය' යනු කුමක්දැයි ඔබේ වචනයෙන් කෙටියෙන් පැහැදිලි කරන්න.

05. "මානව සමාජ හැසිරීම් අධ්‍යයනය සඳහා වඩාත් යෝග්‍යය ක්‍රමයක් ලෙස නිරීක්ෂණය හැඳින්විය හැකි ය."

    ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

06. සම වයස් කණ්ඩායම්වල සිටින විවිධ ළමුන් අතර තිබිය හැකි පෞරුෂ වර්ග හතරක් (04) ලියන්න.

07. "ස්ත්‍රී පුරුෂ සමාජභාවය" සහ "ස්ත්‍රී පුරුෂභාවය" අතර ඇති වෙනස කෙටියෙන් විස්තර කරන්න.

08. ඔල්පොට්ගේ අගති න්‍යායේ මට්ටම් අනුපිළිවෙලින් ලියන්න.

( ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) මානව වර්ගයාගේ සමාජ හැසිරීම් අධ්‍යයනය සඳහා භාවිත කෙරෙන ක්‍රම තුනක් (03) ලියන්න. (ලකුණු 03)

(ii) සමාජ මනෝවිද්‍යාත්මක පර්යේෂණ ක්‍රියාත්මක කිරීමේ දී අනුගමනය කළයුතු ආචාරධර්ම දෙකක් (02) විස්තර කරන්න. (ලකුණු 07)

(iii) ප්‍රාථමික පාසල් ගුරුවරියන් සඳහා මානව සමාජ හැසිරීම් පිළිබඳ දැනුම ප්‍රයෝජනවත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. (i) 'ස්ත්‍රී පුරුෂ සමාජභාව අසමානතාව' සහ 'වෙනස්කොට සැලකුම' යන පද කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) සමාජය තුල කාන්තාවගේ ත්‍රිත්ව භූමිකාව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ දක්නට ලැබෙන ලිංගික භාවයට අදාළ ගැටලු තුනක් (03) උදාහරණ දක්වමින් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 09)

11. (i) හිතකර සමාජ චර්යා පහක් (05) ලැයිස්තු ගත කරන්න. (ලකුණු 05)

(ii) හිතකර සමාජ චර්යා ඇතිවීමට බලපාන සාධක හතරක් (04) පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) පන්තිකාමරය තුළ හිතකර සමාජ චර්යා සංවර්ධනය කිරීමේ දී ප්‍රාථමික පාසල් ගුරුවරියක තුළ තිබිය යුතු ගුණාංග විස්තර කරන්න. (ලකුණු 07)

12. (i) ප්‍රාථමික පාසල් ළමුන් අතර දැකිය හැකි ප්‍රාථමික සමාජ සබඳතා දෙකක් (02) සහ ද්විතියික සබඳතා දෙකක් (02) විස්තර කරන්න. (ලකුණු 10)

(ii) ප්‍රාථමික පාසල් කාලය තුළ දී මිත්‍රත්වයේ ඇති වැදගත්කම උදාහරණ පහක් (05) දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) අවශ්‍යතා න්‍යාය

(ii) ළමුන් අතර දක්නට ලැබෙන ආක්‍රමණශීලී චර්යා

(iii) පෙරපාසල් දරුවන්ගේ සමාජයීය සංවර්ධනය (ලකුණු 10 x 02 = 20)

හිමිකම් ඇවිරිණි.